# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2018 අංක 14 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2018 ජූනි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2018 ජූනි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 10.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2018 අංක 14 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 ජුනි මස 18 වන දින]

එල්. ඩී—ඕ. 29/2009.

**(129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක 14 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතෙහි 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 129 වන අධිකාරයේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ 18ආ වගන්තියේ—

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) මේ කොටස අදාළ වන ස්ත්‍රී සේවකයකුට දරු ප්‍රසූතියක් වුවහොත් ඇයට—

(අ) එම දරු ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත් එම දරු ප්‍රසූතියේ දින සිට ආරම්භ වන දින හැත්තෑවක කාලසීමාවක් සඳහා; සහ

(ආ) එම දරු ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්, එම දරු ප්‍රසූතියේ දින සිට ආරම්භ වන දින විසි අටක කාලසීමාවක් සඳහා,

නිවාඩු ලබා ගැනීමට එම තැනැත්තියට හිමිකම ඇති අතර, අදාළ සේවායෝජකයා විසින් එම නිවාඩු ලබා දිය යුතු ය.'';

(ආ) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

(2) 18ඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර එය 18ඈ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"මව්කිරි දෙන මව්වරුන් සඳහා මව්කිරි දීමේ විවේක කාල සැලසීම.

18ඈ. යම් සාප්පුවක හෝ කාර්යාලයක, ස්ත්‍රී සේවකයකු විසින් වයස එක් අවුරුද්දකට අඩු දරුවකුට මව්කිරි දෙන්නේ නම්, පැය නමයක කාලයක දී, ඇයට අවශ්‍ය පරිදි යම් වේලාවන්හි දී, මව්කිරි දීමේ විවේක කාල දෙකක් සඳහා සේවායෝජකයා විසින් ඉඩ දිය යුතු ය. ඒ දරුවාට කිරි දීම සඳහා ඒ ස්ත්‍රී සේවකයාට ඒ සේවායෝජක විසින් දරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් සලසා ඇති අවස්ථාවක එක් එක් විවේක කාලය විනාඩි තිහකට නොඅඩු විය යුතු අතර, දරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් එසේ සලසා නොමැති අවස්ථාවක, එක් එක් විවේක කාලය එක් පැයකට නොඅඩු විය යුතු ය. තව ද, එය යම් ලිඛිත නීතියක් යටතේ එම ස්ත්‍රී සේවකයාට ආහාර හෝ විවේකය සඳහා සලසන ලද යම් විවේක කාලයකට අතිරේකව විය යුතු අතර, ඇගේ සේවා නියුක්තියේ කාර්ය සඳහා ඒ කාලය ඇගේ සේවා නියුක්තියෙහි ඇය වැඩ කළ කාලය වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.